# ඇබෑර්තු

## දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## වාරිමාර්ග අමාත්‍යාංශය

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය සඳහා වන ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිය සඳහා අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා රජයේ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව පහත සඳහන් තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් හා හිතෛෂී ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වයස අවු. 62 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි බසින් චතුර ලෙස කථා කළ හා කටයුතු කිරීමට හැකිවීම හා රජයේ රෙගුලාසි පිළිබඳව නිපුණතාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවන් වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

| අංකය | PS කාණ්ඩය | තනතුර | තනතුරු සංඛ්‍යාව | අදාළ වන චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 3 | Senior Social Safeguard & Resettlement Specialist | 01 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1/2019 |
| 02 | PS 3 | Senior Environmental Safeguard Specialist | 01 | |
| 03 | PS 4 | Project Engineer (Contract Management) | 01 | |
| 04 | PS 5 | Social & Environment Safeguard Officer | 01 | |

ඉහත සඳහන් චක්‍රලේඛය පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා www.irrigationmin.gov.lk හා මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිසෙන්න.

එක් එක් තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරේ නම සඳහන් කර 2022 මාර්තු 15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

**වැඩබලන ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA),**
**අංක : 11, ජාවත්ත පාර, කොළඹ 05.**

කෙටි ලයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඕනෑම බලපෑමක් කිරීම නුසුදුසුකමක් වන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**
**දිනය : 2022-03-03**